සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය(සැකසුම - ඩබ් චන්ද්‍රිකා සමරසිංහ)

11සතිය 12 පාඩම - ආනන්ද කුමාරස්වාමි

1.මෙම වචනවල අරුත් වරහන් තුළින් තෝරා ලියන්න

*අදීන - ............... *ප්‍රමුඛ - ............. * විශ්‍රැත - .............. * ප්‍රයත්න- ................ * ලාක්ෂා - ...............

* ශෛලමය - ........... * විචාරක්ෂිය- ............ * පෘෂ්ඨය - ............ * සභ්‍යත්වය - ......... * භාග්‍යය - ..............

( වාසනාව, උත්සාහය,මතුපිට,විමසුම් ඇස,නිවහල්,මූලික , ප්‍රසිද්ධ , හැදියාව, ගලින් ම නිම වූ ,ලාකඩ )

2.මෙම වැකි සත්‍ය ද අසත්‍ය ද කියා වරහන තුළ සටහන් කරන්න

1.ආනන්ද කුමාරස්වාමි දහ නව වන සියවසේ ආසියාවේ පහළ වූ ශ්‍රේෂ්ඨතමයා ලෙස හැඳින්වේ. (..........)

2.බටහිර අධ්‍යාපනය ලත් බොහෝ ආසියාතිකයෝ තම ආවේණික සංස්කෘතික උරුම හැර දැමූහ. (.........)

3.ආනන්ද කේ. කුමාරස්වාමි පෙරදිග දර්ශනය පමණක් මහත් අභිරුචියෙන් පරිශීලනය කළේ ය. (........)

3)මෙම ඡේදයේ හිස්තැන් පුරවන්න

ආනන්ද කුමාරස්වාමි මහතා ............ අගෝස්තු මස විසි දෙවන දින කොල්ලුපිටියේ දී උපත ලදි.පියා ශ්‍රීමත් ................ මහතා ය.

ඔහු කුඩා කල ම ඔහුගේ ........... මිය ගියේ ය.කුමාරස්වාමි පරපුර යාපනයේ ................ උසස් පරපුරකට අයත් වූහ.ඔවුහු ප්‍රභල ..............මෙහෙවරක නිරත වූවෝ ද වෙති. ............... සැප්තැම්බර් මස දහනව වැනි දා ආනන්ද කුමාරස්වාමි මහතා අභාවප්‍රාප්ත විය.

4)ඔබ ආනන්ද කුමාරස්වාමි යයි සිතා එතුමාගේ අධ්‍යාපනික තොරතුරු යහළුවෙකුට පවසන්න.

5)කෙටි පිළිතුරු සපයන්න

1.ආනන්ද කුමාරස්වාමි මහතා ප්‍රථම පන්තියේ විද්‍යාවේදී ගෞරව උපාධියක් දිනා ගත්තේ කුමන විෂයයන් සම්බන්ධයෙන් ද?

2.ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් එතුමාට ආචාර්ය උපාධියක් පිරිනැමුණේ කුමක් සඳහා ද?

3.Ceylon National Review සඟරාවේ පළ වූ නිදහස් සටනට ඉමහත් ජීවයක් ලබා දුන් ලිපි මොනවා ද?

4.බටහිර සංස්කෘතියෙන් මිදීමට ගත යුතු ක්‍රියා මාර්ග දෙක ලෙස එතුමා සඳහන් කළේ මොනවා ද?

5.ලාංකික කලාව, ලෝක කලා සිතියමේ ප්‍රථම වරට රැඳ වූ ඓතිහාසික කෘතිය කුමක් ද?

6.මධ්‍යකාලීන සිංහල කලා කෘතියේ අරමුණ කෙටියෙන් ලියා දක්වන්න 7.එම කෘතියෙහි සඳහන් කලා ක්ෂේත්‍ර හා කර්මාන්ත ලියා දක්වන්න

8.එතුමා සඳහන් කළ පරිදි සීගිරි ගලේ බදාම යෙදූ පෘෂ්ඨය සාදා ගෙන ඇත්තේ කෙසේ ද?

9.සීගිරි චිත්‍ර පිළිබඳ එතුමාගේ අදහස කුමක්ද? 10.මෙතුමා දැන සිටි භාෂා මොනවා ද?

11.එතුමාගේ සියලු දේපල රාජසන්තක කිරීමට හේතුව කුමක් ද?

12.කලා ශිල්ප පිළිබඳ ඔහු අධ්‍යයනය කළ , අවධානයට ලක් කළ පෙරදිග රටවල් සිතියමක ලකුණු කරන්න

6)මෙම වැකි නිවැරදි කර නැවත ලියන්න

*කුමාරස්වාමි මහතා පෙර'පර දෙදිග භාෂා හැදෑරුවේ භාෂා විශාරදයෙකු වීමට ය *කුමාරස්වාමිගේ ශාස්ත්‍රීය අධ්‍යාපනය එක් විෂය ක්ෂේත්‍රයකට සීමා විය * ලංකාවේ පුවත්පත් සඟරා සඳහා පමණක් ඔහු ලිපි ලිව්වේ ය. *කුමාරස්වාමි මහතාගේ නිත්‍ය වාසස්ථානය වූයේ ලංකාවයි. * ජීවිතයේ අවසන් කාලය ගත කිරීමට ඔහු තුළ වූ අපේක්ෂාව මුදුන්පත් විය.

7) "මුළු ලොවට ම මිණි පහනක් වූ ආනන්ද කමාරස්වාමි" මැයෙන් රචනයක් ලියන්න

.